<u>බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාව</u>
<u>කෑගල්ල දිස්ත්‍රික්කය</u>

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූනි 25 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

| | ගිණුම්කරණ අඩුපාඩුව | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2015 සිට 2018 දක්වා වර්ෂ වලට අදාල මුද්දර ගාස්තු උපලේඛන සකස් කිරීම වෙනුවෙන් ගෙවිය යුතු රු.187,300 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ණයහිමි ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදි මෙවැනි අඩුපාඩු ඇති වීම වැළැක්වීමට කටයුතු කරමි. . |
| (ii) | ඉකුත් වර්ෂයට අදාලව දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය වාරික රු.746,897 ක් ආපසු ගෙවියයුතු තැන්පත් ලෙස ගිණුම්ගතකර තිබුණි. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත |
| (iii) | සමාලෝචිත වර්ෂයේදී පළාත් සභාවෙන් හා ගම නැගුම ව්‍යාපෘතියෙන් ලැබී තිබුණු ප්‍රාග්ධන ආධාර රු. 163,409,224 ක් තැන්පත් යටතේ ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුවේ. | වෙනත් ආයතන වල මූල්‍ය ප්‍රතිපාදන යටතේ සංවර්ධන ව්‍යාපෘති සඳහා ලැබෙන ප්‍රතිපාදන ඉදිරි වර්ෂයේ සිට ප්‍රාග්ධන ආධාර යටතේ සටහන් කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | සේවකයන්ගෙන් අය කර තිබූ ඇප රු. 77,900 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුවේ. | සේවක ඇප අයකරනු ලබන නිළධාරීන්ගේ හා සේවකයින්ගේ ඇප තැන්පතු වෙනුවෙන් ගිණුම් ආරම්භ කර ඇති අතර මෙම තත්වය නිරවුල් කර ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |

**(ආ) අසම්භාව්‍ය බැරකම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවට එරෙහිව බාහිර පාර්ශ්වයන් 02 ක් විසින් පවරා තිබූ නඩු පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි. | අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේ සිට අසම්භාව්‍ය බැරකම් පිළිබඳ විස්තර ගිණුමට ඇතුලත් කිරීමට කටයුතු කරමි. |

**(ඇ) නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම් විෂයයන් 07 ක ශේෂ හා උපයෝගී ලේඛන/වාර්තා ශේෂ අතර රු. 20,971,230 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළයුතුවේ. | අවසන් ගිණුම සකස් කිරීම සඳහා පාදක කර ගෙන ඇත්තේ එක් එක් විෂයන් සඳහා වූ ලේඛන වන අතර භාණ්ඩ සමීක්ෂණ වාර්තාව නොවේ. |

**1.4 අනුකූල නොවීම**

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි හා කලමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|---|
| (අ) | 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනත | | | |
| | (i) 10 වගන්තිය | සමාලෝචිත වර්ෂය අවසාන දිනට ඉඩම් සංවර්ධන බලපත්‍ර 10 ක කාලය දීර්සකර ගැනීමට හෝ අනුකූලතා සහතික ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඔබ විසින් සඳහන් කර ඇති අදහස් සාවද්‍ය නොවේ. |
| | (ii) 67 වගන්තිය | පනතේ විධිවිධාන ප්‍රකාරව 2007 සිට 2018 දක්වා අනුමත කළ ගොඩනැගිලි අයදුම්පත් 400 කට අනුකූලතා සහතික 22 ක් පමණක් ලබාදී තිබුණි. . | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඔබ විසින් සඳහන් කර ඇති අදහස් සාවද්‍ය නොවේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මුදල් රෙගුලාසි 1646 | සභාව සතු වාහන 10 ක ධාවන සටහන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටද විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතුවේ. | ඔබ විසින් දක්වා ඇති අදහස් සාවද්‍ය නොවේ. |
| (ඇ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| | (i) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන | 2019 මැයි 07 දින වන විටත් නිලධාරින්ගේ පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව | ඇඟිලි සලකුණු යන්ත්‍රයක් ලබා ගැනීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| | චක්‍රලේඛය | ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි. | කටයුතු කළයුතුවේ. | |
| | (ii) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන 07 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහන පරීක්ෂාවක් සිදු කර නොතිබුණි | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුවේ. | වාහන 04 ක් සම්බන්ධව ඉන්ධන දැවීම පරීක්ෂා කර ඇති අතර මයිලෝමීටර් අක්‍රීය වාහන 03ක ඉන්ධන පරීක්ෂාව සිදුකිරීමට නොහැකිවී ඇත. |
| (ඇ) | 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 2 ඡේදය | 2009 වර්ෂයෙන් පසුව වරිපනම් තක්සේරුවක් සිදුකර නොතිබුණි. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුවේ. | මේ පිළිබඳව ලිඛිතව මෙන්ම වාචිකවද තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇත. |

2 මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,081,841 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,680,855 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
--------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදයම්
--------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදයම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i | වරිපනම් හා බදු | 1,735,400 | 1,351,669 | 1,761,554 | 140,075 | 1.445,560 | 1,350,362 | 1,767,982 | 108,979 |
| ii | කුලී | 1.540,950 | 1,540,950 | 1.064,297 | 523,465 | 1,757,300 | 1,442,751 | 1,442,751 | 523,465 |
| iii | බලපත්‍ර ගාස්තු | 298,100 | 277,768 | 277,768 | - | 362,700 | 259,532 | 259,532 | - |
| iv | වෙනත් ආදායම් | 39,056,888 | 36,260,941 | 36,260,941 | 19,893,307 | 38,612,644 | 27,607,972 | 27,607,972 | 4,275,571 |

## 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 ජනවාරි 01 දිනට ආදායම් විෂයයන් 02 ක ශේෂය රු.545,557 ක් වූවද, වර්ෂයේ රැස්කරන ලද ආදායම රු.9,142 ක් වූයෙන් හිඟ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය අඩු මට්ටමක පැවතුණි. | හිඟ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධව ඔබ විසින් දක්වා ඇති අදහස් පිළිගනිමි. |

## 2.2.3 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී සිදුකරන ලද කර්මාන්ත හා වෙළඳ ව්‍යාපාර පිළිබඳ සමීක්ෂණයට අනුව පාරිසරික බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත 25 ක් වෙනුවෙන් බලපත්‍ර නිකුත් නොකිරීම නිසා රු. 100,000 ක ආදායමක් සභාවට අහිමිවී තිබුණි. | කර්මාන්ත හා වෙළඳ ව්‍යාපාර සඳහා පාරිසරික බලපත්‍ර ලබා දීමට පියවර ගත යුතුවේ. | පරිසර බලපත්‍ර ලබා නොගත් ආයතන දැනුවත් කර ඇති අතර සමහර ආයතන ක්‍රියාත්මක නොවන අතර සමහර ආයතන බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කර ඇත. |

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් නිලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු 4,515,751.ක් හා රු. 15,377,556 ක් විය. | ලැබියයුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම මුදල් ලබා දෙන මෙන් සබරගමුව පළාත් සභාවෙන් ලිඛිතව ඉල්ලීම් කර ඇත. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 09 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018දෙසැම්බර් 31 වන විට සම්මත අතුරු ව්‍යවස්ථා පමණක් වැලඳ ගෙන තිබුණි. | අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළයුතුවේ. | අදාහනාගාර අතුරු ව්‍යවස්ථාව මේවන විට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කර ඇති අතර තවත් අතුරු ව්‍යවස්ථා 4 ක් පනවා ගැනීමට අදාළ මූලික කටයුතු කරමින් පවතී. |

**(ආ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, වර්ෂය අවසානයට ප්‍රගතිය දැක්වෙන වාර්තාවක් පිළියෙල නොකිරීම හේතුවෙන් අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීම පිළිබඳව පරීක්ෂා කල නොහැකි විය. | ප්‍රගතිය දැක්වෙන කාර්යය සාධන වාර්තාවක් පිළියෙල කළ යුතුවේ. | මෙ දක්වා වාර්ෂික සැලසුම් ප්‍රගතිය දැක්වීමට කාර්යසාධන වාර්තාවක් සකස් කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් එවැනි වාර්තාවක් සකස් කර නොමැති අතර 2019 වර්ෂයේ සිට කාර්ය සාධන ප්‍රගති වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

**(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය වටා වැටක් හා ගේට්ටුවක් ඉදිකර නොතිබුණු අතර ප්ලාස්ටික් , පොලිතින් වැනි නොදිරන අපද්‍රව්‍ය විධිමත්ව බැහැර කර නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය වටා වැටක් හා ගේට්ටුවක් ඉදිකර මධ්‍යස්ථානය විධිමත්ව පවත්වාගෙන යා යුතුවේ. | ඉදිරියේදි ආරක්ෂිත වැටක් සකස් කිරීමට කටයුතු කරමි. . |

**(ඈ) පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ගලි අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සුදුසු ස්ථානයක් සභාවට නොතිබුණ බැවින් ගලි බැහැර කිරීමට සුදුසු ස්ථානයක් ඇති අයට පමණක් එම සේවාව ලබාදී තිබුණි. | ගලි අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සුදුසු ස්ථානයක් ස්ථාපනය කළ යුතුවේ. | ගලි අපද්‍රව්‍ය බැහැර කිරීමට සුදුසු භූමියක් සභාව සතුව නොමැති බැවින් මෙවැනි තත්වයක් ඇති වී ඇත. |

**(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්වය හා සෞඛ්‍ය නංවාලීම සඳහා වන සැලසුම් සකස් කර තිබුණද, අරමුදල් නොමැතිවීම මත ඒවා ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක ලඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. | ඔබ විසින් දක්වා ඇති අදහස් පිළිගනිමි. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු වර්ග 06 ක පුරප්පාඩු 06 ක් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පුරප්පාඩු තනතුරු පිළිබඳ අදාළ ආයතන දැනුවත් කර ඇතත් මේ දක්වාම එම පුරප්පාඩු සම්පූර්ණ කර නොමැත. |

**3.3 වත්කම් කළමනාකරණය**

**3.3.1 වත්කම් වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2006 වර්ෂයේදී ඉඩම් වෙන්දේසි වලින් පොදු කටයුතු සඳහා සභාව වෙත ලබා දී තිබූ රූඩ් 02 පර්චර්ස් 10 ක ඉඩම් ප්‍රමාණය | සභාව සතු වත්කම් ආරක්ෂා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුවේ. | වත්කම් සමීක්ෂණයක් මඟින් තහවුරු කර ගැනීමෙන් පසු ආරක්ෂිත වැටක් ඉදිකිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| | ආරක්ෂා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | ස්ථාවර වත්කම් ලේඛනය අනුව පැවති පොදු ළිං 84 ක් පිළිබඳ සමීක්ෂණයක් කර අයිතිය පැවැත්ම තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි . | සභාව සතු වත්කම් පිළිබඳ සමීක්ෂණයක් කර අයිතිය පැවැත්ම තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම ළිං 84 හඳුනා ගැනීම සඳහා සමීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී. |

**3.3.2 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2015 – 2017 කාලය තුලදී සබරගමුව පළාත් සභාව හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් ලබා දී තිබුණු වටිනාකම රු.42,609,063 ක් වූ වාහන 09 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඔබ විසින් දක්වා ඇති අදහස් පිළිගනිමි. |

**3.3.3 නිෂ්ක්‍රීය වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.3,955,318 ක්වූ වාහන දෙකක් වර්ෂ 3 ක කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි. | නිෂ්ක්‍රීය වාහන සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ඔබ විසින් දක්වා ඇති අදහස් පිළිගනිමි. |

**3.3.4 වාහන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතුව වාහන 11 ක් පැවතියද, තථ්‍ය රියදුරු සංඛ්‍යාව 04 ක් වීම හේතුවෙන් වාහන ඌන උපයෝජනයක් සිදුවී තිබුණි . | සභාව සතු වාහන වලින් ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඔබ විසින් දක්වා ඇති අදහස් පිළිගනිමි. |

**3.5 ප්‍රසම්පාදනය**

**3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණනනිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණ අතර රු.1,622,463 ක්වූ මිලදීගැනීම් සිදුකර තිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුය. | ඔබ විසින් දක්වා ඇති අදහස් පිළිගනිමි. |

**4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 විගණන හා කළමනාකරණ කමිටු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතුය. | ඔබ විසින් දක්වා ඇති අදහස් පිළිගනිමි. |